# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2477/44 - 2026 පෙබරවාරි මස 27 වැනි සිකුරාදා - 2026.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**යාවත්කාලීන කරන ලද අනුරාධපුර පූජා භූමි සංවර්ධන සැලැස්ම ප්‍රකාශයට පත්කිරීම**

2000 අංක 49 දරන පනතින් සංශෝධිත 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතෙහි 28 (2) වගන්තියෙන් නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025.10.08 දින අනුමත කරන ලද යාවත්කාලීන කරන ලද **අනුරාධපුර පූජා භූමි සංවර්ධන සැලැස්ම සහ සංවර්ධනය කිරීමේදී අනුගමනය කළයුතු නිර්ණායක**, එම පනතේ 31 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය බිමල් නිරෝෂන් රත්නායක වන මම, මහජනතාවගේ දැන ගැනීම පිණිස මෙසේ ප්‍රකාශයට පත් කරමි.

**බිමල් නිරෝෂන් රත්නායක** (පා.ම),
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය.

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
6 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II,
බත්තරමුල්ල.

2026 පෙබරවාරි මස 18 වැනි දින.

1A - PG 7594 — 28 (2026/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. හැඳින්වීම

1.1 පූජා භූමියේ පිහිටීම

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් (එවකට නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව) අනුරාධපුර පූජා භූමි සීමාව හඳුනාගෙන, 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ විධිවිධාන යටතේ අංක 159 හා 1981/09/18 දිනැති *ගැසට් පත්‍රය* (ඇමුණුම 01) මගින් අනුරාධපුර පූජා භූමිය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

ඉන් අනතුරුව එම ප්‍රදේශය විධිමත් ලෙස සංවර්ධනය කිරීම සහ නියාමනය කිරීමේ අරමුණින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වින්‍යාස සැලැස්මක් සකස් කරනු ලැබූ අතර එම වින්‍යාස සැලැසුම **'අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය'** ලෙස *ගැසට්* මගින් ප්‍රකාශයට පත්කර ඇත. එම සැලැස්මට අනුව අනුරාධපුර පූජා භූමියේ සංවර්ධන කටයුතු සිදු කරනු ලබයි.

**සිතියම් අංක 1.1 - අනුරාධපුර පූජා නගරයේ පිහිටීම**




1.2 පූජා භූමි වින්‍යාස සැලැස්ම යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව (එවකට නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව) විසින් 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ විධිවිධාන යටතේ අංක 159 හා 1981/09/18 දිනැති *ගැසට් පත්‍රය* මගින් අනුරාධපුර

පූජා භූමිය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, 1984 වර්ෂයේ දී එම පූජා භූමිය සඳහා වින්‍යාස සැලැස්මක් සකස් කර අනුරාධපුර සැලසුම් යෝජනා ක්‍රමය ලෙස *ගැසට්* කරන ලදී.

අදාළ ආයතනවල අනුමැතියන් සහ අධීක්ෂණයෙන් තොරව අනුරාධපුර පූජා භූමි සීමාව තුළ නොයෙකුත් ඉදිකිරීම් සිදුවෙමින් පවතී. එමෙන්ම අනුරාධපුර නව නගරය සීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් ජනාකීර්ණ නගරයක් බවට පත් වෙමින් පවතී. නව නගරය සහ පූජා භූමි ප්‍රදේශය ඉතා ආසන්නව පිහිටා තිබෙන බැවින් නාගරීකරණයේ අයහපත් බලපෑම් පූජා භූමියේ තිරසාර පැවැත්මට තර්ජනයක් වෙමින් පවතී. තවද, බුදු දහම මත පදනම්ව ගොඩනැගුණු මෙම පූජා භූමියට නව්‍ය නාගරීකරණ මුහුණුවරක් ද නොගැළපේ. මේ නිසා නගර මධ්‍යයේ පවතින තදබදය සහ නාගරීකරණ ලක්ෂණ පූජා භූමිය කරා ව්‍යාප්ත වීම විධිමත් පරිදි පාලනය කිරීම සඳහා මීට වසර 40 කට පමණ පෙර 1984 දී අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය යටතේ සකස් කරන ලද අනුරාධපුර පූජාභූමි වින්‍යාස සැලැස්ම යාවත්කාලීන කිරීම කාලීන අවශ්‍යතාවයකි.

ඒ අනුව, පූජා භූමියට ඇතුළත් විය යුතු තවත් පූජනීය සිද්ධස්ථාන සහ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන ඇතුළත් කර පුළුල් කරන ලද නව පූජා භූමි සීමාව, පූජා භූමිය තුළ සංවර්ධන කටයුතු සිදු කිරීමේදී අනුගමනය කළ යුතු නිර්ණායක, අටමස්ථානයට අයත් සිද්ධස්ථාන සඳහා වින්‍යාස සැලසුම් සහ වර්තමානයට ගැලපෙන උපායමාර්ගික සැලසුම් මෙම වින්‍යාස සැලැස්මට අන්තර්ගත වේ.

### 1.3 පූජා භූමියේ සීමාව

1981 වර්ෂයේදී අනුරාධපුර පූජා භූමිය ලෙස ගැසට් මගින් ප්‍රකාශිත වර්ග කිලෝමීටර 28 ක පූජා භූමි සීමාවේ අටමස්ථානය ඇතුලත් ඓතිහාසික වටිනාකමකින් යුත් ස්ථානයන්ගෙන් සමන්විත අධි සංවේදී සහ සංවේදී කලාපයන්ට සිදුවන සංවර්ධනයේ බලපෑම අවම කරගැනීමටත්, ඓතිහාසික හා පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුත් සිද්ධස්ථාන සහ නටඹුන් රැසක් පූජා භූමි සීමාවෙන් පිටත විසිරී පවතින නිසාත්, ජනගහන වර්ධනය සමඟ ඇතිවන නාගරීකරණයේ අහිසි බලපෑම්වලට ලක්වෙමින් පවතින මෙම සිද්ධස්ථාන සහ නටඹුන් මතු පරපුරට ආරක්ෂා කරගැනීමටත් එම ස්ථානද ඇතුළත් වන ලෙස පූජා භූමි සීමාව පුළුල් කිරීම අත්‍යාවශ්‍ය විය. ඒ අනුව, වර්ග කිලෝමීටර 38 දක්වා පූජා භූමියේ සීමාව පුළුල් කිරීමෙන් අධිසංවේදී හා සංවේදී කලාපයන් ඇතුලත් වර්ග කිලෝමීටර 28ක් පමණ වන පූජා භූමියේ සුරක්ෂිතතාවය තහවුරු කිරීමට පියවර ගන්නා ලදී.

**සිතියම් අංක 1.2 අනුරාධපුර පූජා භූමියේ අධිසංවේදී කලාපයේ සීමාව**




**සිතියම් අංක 1.3 - අධිසංවේදී හා සංවේදී කලාපයන් ඇතුලත් අනුරාධපුර පූජා භූමියේ සීමාව (වර්ග කිලෝමීටර 28)**



**සිතියම් අංක 1.4 වර්ග කිලෝමීටර 38ට අයත් සීමාව**




(ඇමුණුම 02 - 1981 .09.18 දිනැති අංක 159 දරන *ගැසට් පත්‍රය* මඟින් ප්‍රකාශිත පූජා භූමි සීමාව සහ පොදු පහසුකම් කලාපය ඇතුලත් ව.කි.38ක සීමාව)

2.0 දැක්ම සහ අභිමතාර්ථ **(Vision & Goals)**

දැක්ම **(Vision)**

*උරුමයන් සුරැකි සුවදෙන නීල හරිත පුදබිම*

උරුමයන් සුරැකි

ශත වර්ෂ පසළොසකට ආසන්න ඉතිහාසයකට නෑකම් කියන, අනුරාධපුරයේ පවතින ඓතිහාසික ස්මාරකයන්ගෙන් සමන්විත පූජනීය ස්ථානයන්ගෙන් අනූන, අතීතයේ ශ්‍රී විභූතිය කියාපාන අපගේ උරුමයන් මතුපරපුරටත් භාවිතාකිරීමට හැකිවන ලෙස සංරක්ෂණය කර තැබීම මෙයින් නිරූපණය වේ.

සුවදෙන

මෙම පුදබිමට පැමිණෙන දහස් සංඛ්‍යාත දෙස් විදෙස් බැතිමතුන් සඳහා අවශ්‍ය පහසුකම් සහිත සෞඛ්‍යාරක්ෂිත, ප්‍රියජනක පරිසරයක් නිර්මාණය කිරීම තුළින් මානසික සුවයක් ලබා දීමත්, ප්‍රදේශයේ ජනතාවට තම ජීවනෝපාය කරගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම තුලින් ප්‍රදේශවාසීන්ට සහ බැතිමතුන්ට පහසුකම්වලින් සපිරි පරිසරයක් නිර්මාණය කිරීම මෙයින් නිරූපණය වේ.

නීල හරිත පූජනීය පුද බිම

මෙම භද්‍ර කල්පයේ පහළ වූ කකුසඳ, කෝණාගම, කාශ්‍යප සහ ගෞතම යන සිව් බුදුවරුන්ගේ පාද ස්පර්ශය ලැබූ, ගෞතම බුදුන්වහන්සේගේ සර්වඥ ධාතූන්වහන්සේලා තැන්පත් කර ඉදි වූ වෙහෙරවලින් පෝෂිත, වැව් පොකුණු රාශියකින් කුඹුරු හා වෘක්ෂලතාවලින් ගහන වූ පුද බිම මෙයින් නිරූපණය වේ.

මෙම පුදබිමේ ඓතිහාසික ආගමික පාරිසරික සංස්කෘතික අගයන් ආරක්ෂාවන පරිදිත්, එම පූජනීය ස්ථානයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් සඳහා පහසුව හා සුවය ලබාදීමට හැකි වන ලෙසත්, ඉතිහාසයේ අනුරාධපුරයට හිමි වූ ස්ථානීය වටිනාකම ඒ අයුරින්ම හිමිකර දෙමින් එහි සැබෑ ගුණාත්මක බව ජනයා වෙත හැඟෙන ලෙස ඉතිහාසය පිළිබඳ ආදරයක්, ඇල්මක් හා ආගමික භක්තියක් ඇති කිරීමත් හා ප්‍රදේශවාසීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමත් සිදුවන පරිදි අනුරාධපුර පූජා භූමිය නිර්මාණය කිරීම අපේක්ෂාව වේ.

### අභිමතාර්ථ (Goals)

**1. පුරා විද්‍යා වටිනාකම් සංරක්ෂණය සහ අනන්‍ය පරිසර පද්ධතීන් සුරැකීම**

අනුරාධපුර පූජනීය ප්‍රදේශයේ පිහිටි පුරා විද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන, ගොඩනැගිලි හා ආගමික වශයෙන් වැදගත් වෙහෙර විහාර ආදිය සහ වනාන්තර, කුඹුරු, වැව්, පොකුණු හා ජල පෝෂක ප්‍රදේශ මෙන්ම ඒ හා බැඳුණු වාරි කර්මාන්තය ආදී වූ අනුරාධපුරයට අනන්‍ය පරිසර පද්ධතීන් මතු පරපුර උදෙසා සුරැකීම ප්‍රධාන අභිමතාර්ථයකි.

**2. බැතිමතුන් සහ සංචාරකයන් සඳහා පහසුකම් සැලසීම**

අනුරාධපුර පූජනීය ප්‍රදේශයට දිනපතා මෙන්ම වෙසක්, පොසොන් පොහෝ දින ඇතුළු උත්සව වලදී සහ පිච්චමල් පූජාව අලුත් සහල් මංගල්‍යය හා අනෙකුත් පූජා උපහාර සඳහා වාර්ෂිකව පැමිණෙන දෙස් විදෙස් බැතිමතුන් හා සංචාරකයින් සඳහා අවශ්‍ය මූලික පහසුකම් සැලසීමද ප්‍රධාන අභිමතාර්ථයකි.

**3. ප්‍රදේශවාසීන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම**

කෘෂි කර්මාන්තය, වෙළඳාම සහ සංචාරක කර්මාන්තය ජීවනෝපාය කරගෙන අනුරාධපුර පූජනීය ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා එම අංශයන්ට පහසුකම් සැලසීම සහ නව ආදායම් උත්පාදන මාර්ග ප්‍රවර්ධනය ප්‍රධාන අභිමතාර්ථයකි.

## 3. සංකල්පීය සැලැස්ම (Conceptual Plan)

### 3.1 සංකල්පීය සැලැස්ම

මල්වතු ඔය අසබඩ වැව්, පොකුණු රාශියකින් පෝෂණය වන කෙත් වතුවලින් වටවූ හරිත කලාපයක අටමස්ථානය ඇතුළු ඓතිහාසික ස්ථාන රැසකින් සමන්විත අනුරාධපුර පූජා භූමිය පිහිටා ඇත. ඈත අතීතයේදී ප්‍රථම රාජධානිය ලෙස ආරම්භව අද දක්වා මෙම පූජා භූමිය සංවර්ධන වී ඇත. ජනගහන වර්ධනයත් සමග බැතිමතුන්ගේ පැමිණීමේ වැඩිවීම සහ නාගරීකරණය සමග සංවර්ධනයේ අනිටු ප්‍රතිඵලවලට අනුරාධපුර පූජා භූමිය ක්‍රමයෙන් ගොදුරු වෙමින් පවතින අතර අනුරාධපුර පූජා භූමියට පැමිණෙන ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන්ගේ අවශ්‍යතා අවිධිමත් පරිදි සපුරාලීමට යැමේදී අනුරාධපුර පූජනීයත්වයට සහ උරුමයන්ට හානි සිදුවෙමින් පවතී.

අනුරාධපුර පූජා භූමියේ අනාගත සංවර්ධනය කෙසේ විය යුතු දැයි මෙම සංකල්පීය සැලැස්මෙන් ඉදිරිපත් කරයි. පූජා භූමි මධ්‍යයේ අටමස්ථානය ඇතුළු අනෙකුත් ඓතිහාසික සිද්ධස්ථාන පිහිටි ප්‍රදේශය **අධි සංවේදී කලාපය (A)** ලෙස හඳුනාගැනීම සහ එහි සංවර්ධනය සීමාකිරීම තුළින් එම උරුමයන් මතු පරපුර වෙනුවෙන් සංරක්ෂණය කිරීම මෙම සැලැස්මෙන් නිරූපණය වේ.

**සිතියම් අංක 3.1 - සංකල්පීය සැලැස්ම**



පදිංචිකරුවන්ගේ සහ පූජා භූමියට පැමිණෙන බැතිමතුන් සහ සංචාරකයින් සඳහා අවශ්‍ය මූලික පහසුකම් සැපයීමට අධි සංවේදී ප්‍රදේශයට බාහිරින් පිහිටි **සංවේදී කලාපය (B)** තුළ විධිමත්ව සිදුකිරීමට ඉඩ ලබාදීම මගින් සංවර්ධනය සීමාකරනු ලබයි.

සංවේදී කලාපයට පිටතින් පිහිටි **පොදු පහසුකම් කලාපය (C)** ආර්ථික කටයුතු ප්‍රවර්ධනය සඳහා හඳුනාගෙන ඇත.

පුරා විද්‍යා වටිනාකමින් යුත් ස්ථාන ඒකරාශී වූ මධ්‍ය ප්‍රදේශය හෙවත් අධිසංවේදී කලාපයට බාහිර සංවර්ධනයේ අනිසි බලපෑම ක්‍රමයෙන් අඩුවීමෙන් අටමස්ථානය ඇතුළු පුරා වස්තු සුරක්ෂිතවීමත්, බැතිමතුන්ට සුව පහසුව සැලසීමත්, ප්‍රදේශවාසීන්ගේ ආර්ථික තත්ත්වය නගාසිටුවීමත් තහවුරුවන ලෙස මෙම සංකල්පය ගොඩ නගා ඇත.

### 4.0 අනුරාධපුර පූජා භූමි සංවර්ධන සැලැස්ම

**සිතියම් අංක 4.1 - යාවත්කාලීන කරන ලද අනුරාධපුර පූජාභූමි සංවර්ධන සැළැස්ම**



**5. සංරක්ෂණ සහ සංවර්ධන යෝජනා**

**5.1 පූජා භූමි සීමා හා පිවිසුම් ද්වාර**

**අවශ්‍යතාවය**

පූජා භූමියට අයත් භූමි ප්‍රමාණය නිර්ණය කර ගැනීම, අනුරාධපුර පූජා භූමියට ප්‍රවේශ වීමේදී තමා පූජා භූමියකට ප්‍රවේශවනවාය යන හැඟීම පුද්ගලයන් තුළ ජනිත කිරීම, පූජා භූමියේ එක් එක් සිද්ධස්ථාන පිළිබඳ තොරතුරු හා දෛනිකව පැවැත්වෙන පූජාවන්/පින්කම් පිළිබඳව පූජා භූමියට ප්‍රවේශවන අවස්ථාවේදීම බැතිමතුන්/සංචාරකයින් දැනුවත් කිරීම මෙහි අරමුණ වේ.

**යෝජනා**

- පූජා භූමි සීමාව, අධි සංවේදී කලාපයේ සීමාව සහ සංවේදී කලාපයේ සීමාව භූමියේ භෞතිකව සළකුණු කිරීම. (පූජා භූමි සීමාව, අධි සංවේදී කලාපයේ සීමාව සංවේදී කලාපයේ සීමාව ඇමුණුම 3 මගින් දක්වා ඇත.)

- රුවන්වැලිසෑය වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීම

- පූජා භූමියට පිවිසෙන ප්‍රධාන පිවිසුම් සඳහා ද්වාර ඉදිකිරීම ( අනුරාධපුර පූජා භූමියේ පිවිසුම් ද්වාර ඉදි කිරීමට යෝජිත ස්ථාන සිතියම් අංක 5.1 මගින් දක්වා ඇත.)

    1. කුරුණෑගල - වෙස්සගිරිය මාර්ගයේ 2 කණුව අසල
    2. පැරණි පුත්තලම මාර්ගයෙන් විලච්චිය මාර්ගයට හැරෙන ස්ථානය
    3. වට වන්දනා පාරේ ලෝලුගස්වැව හන්දියට ආසන්නව
    4. පැරණි යාපනය මාර්ගයේ මල්වතු ඔය පාලම අසල
    5. ශ්‍රී මහා බෝධියේ නැගෙනහිර දොරටුව ආසන්නයේ සිංහ කණුව අසල
    6. මිහිඳුපුර ස්ථම්භය අසල

- ඉසුරුමුණි විහාරය හා රන්මසු උයන වෙන්කරන වැට ඉදිකිරීම

**සිතියම් අංක 5.1 - අනුරාධපුර පූජා භූමියේ පිවිසුම් ද්වාර ඉදි කිරීමට යෝජිත ස්ථාන**



### 5.2 පුරාවිද්‍යා වටිනාකම් සහිත ප්‍රදේශ

**අවශ්‍යතාවය**

සංවර්ධන කටයුතු නිසාවෙන් යටපත්වී ඇති පුරාවිද්‍යා වටිනාකම් සහිත ස්ථාන ආරක්‍ෂා කරගැනීම සඳහා අනුරාධපුර පූජා භූමියෙහි ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කර, පුරාවිද්‍යා වටිනාකම් සහිත සියලු ප්‍රදේශ සංරක්‍ෂණය කිරීම හා ඉපැරණි අනුරාධපුර ශිෂ්ටාචාරය පිළිබඳ අධ්‍යයන හා පර්යේෂණ කටයුතු පුළුල් කිරීම මෙහි අරමුණ වේ.

**යෝජනා**

- පුරාවිද්‍යා වටිනාකම් සහිත සියලුම ප්‍රදේශ පුරාවිද්‍යා සංරක්ෂිත කලාප ලෙස ප්‍රකාශයට පත් කොට ආරක්ෂා කිරීම.
- පුරාවිද්‍යා වටිනාකම් සහිත සහ පුරාවිද්‍යා සංරක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල සිටින අනවසර පදිංචි කරුවන් සහ අනවසර ඉදිකිරීම් ඉන් ඉවත් කර එම පදිංචි කරුවන් සඳහා විකල්ප වාසස්ථාන ලබා දීම.
- දැනට හඳුනා නොගත් යම් කිසි ප්‍රදේශයක ඉදිරියේදී පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුත් පුරා වස්තු හමුවුවහොත් එම ප්‍රදේශ පුරා විද්‍යා රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කොට එහි පදිංචිකරුවන් සිටීනම් ඔවුන් සඳහා ද විකල්ප වාසස්ථාන ලබා දීම.

### 5.3 පූජනීය සිද්ධස්ථාන ආශ්‍රිත පහසුකම්

**අවශ්‍යතාවය**

අනුරාධපුර පූජා භූමියේ පිහිටි අටමස්ථානය ඇතුළු අනෙකුත් ප්‍රධාන සිද්ධස්ථානයන්ට අවශ්‍ය සියලු විහාරාංග සම්පූර්ණ කොට සංඝයා වහන්සේලා සහ බැතිමතුන්ගේ වන්දනා කටයුතු සඳහා වන පහසුකම් සංවර්ධනය කිරීම මෙහි අරමුණ වේ.

**යෝජනා**

- පූජා භූමිය තුළ පිහිටි අටමස්ථාන ඇතුළු අනෙකුත් පූජනීය සිද්ධස්ථානවල පහසුකම් සංවර්ධනය කිරීම.
- විහාරාංග ප්‍රතිසංස්කරණය කිරීම
- නව විහාරාංග ඉදි කිරීම.

### 5.4 වන්දනාකරුවන්ගේ පහසුකම්

**අවශ්‍යතාවය**

අනුරාධපුර පුදබිම වැඳ පුදාගැනීමට පැමිණෙන වන්දනාකරුවන් සඳහා ප්‍රමාණවත් නොවන මට්ටමේ පවතින මූලික පහසුකම් (පානීය ජලය, සනීපාරක්‍ෂක පහසුකම්, නවාතැන්, ජල ස්නාන ස්ථාන වැනි) සපයා එයින් පූජා භූමියේ පවිත්‍රතාවය හා පූජා භූමි පරිසරය ආරක්‍ෂාකර ගැනීම මෙහි අරමුණ වේ.

**යෝජනා**

#### 5.4.1 නවාතැන් පහසුකම්

- පූජා කටයුතු සඳහා පැමිණෙන බැතිමතුන් සඳහා නවාතැන් පහසුකම් ලබා දීම.

#### 5.4.2 පානීය ජල පහසුකම්

- පිරිපහදු කරන ලද ජලය සහිත පානීය ජල ටැංකි සිද්ධස්ථාන පරිශ්‍රයන්හි ස්ථාපිත කිරීම
- රාජ්‍ය පොසොන් උත්සවය, පිච්ච මල් පූජාව වැනි උත්සව පැවැත්වෙන දිනවලදී අතිරේක පානීය ජල සැපයුම් ලබා දිය හැකි වන සේ පූජා භූමියේ සුදුසු ස්ථානවල ජල සැපයුම් සම්බන්ධතා සැලසුම් කිරීම.

#### 5.4.3 සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම්

- ස්ථිර සනීපාරක්ෂක පහසුකම් ලබා දීම
- උත්සව කාලවලදී ජංගම ප්‍රථමාධාර ඒකක සහ ජංගම පොදු වැසිකිළි වැනි තාවකාලික ඉදිකිරීම් සඳහා සුදුසු ප්‍රදේශ වෙන් කිරීම.

**5.4.4 ජල ස්නානය සඳහා පහසුකම්**

- ජල ස්නානය සඳහා සුදුසු ස්ථාන හඳුන්වාදීම

**5.4.5 විවේකී ස්ථාන**

- පා ගමනින් ගමන් ගන්නා බැතිමතුන්ගේ විඩාව නිවා ගැනීම සඳහා විවේකී ස්ථාන සැලසුම් කිරීම.

**5.5 ප්‍රවේශ මාර්ග සහ රථගාල්**

**අවශ්‍යතාවය**

විවිධ ප්‍රවාහන මාධ්‍යයන් (පොදු ප්‍රවාහනය, පෞද්ගලික, පාගමනින්) උපයෝගි කරගනිමින් අනුරාධපුර පූජා භූමිය වන්දනාකිරීමට/නැරඹීමට පැමිණෙන බැතිමතුන්ට හා සංචාරකයින්ට පූජා භූමියේ සිද්ධස්ථාන අතර ක්‍රමවත් හා විධිමත් ලෙස සංචරණය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙහි අරමුණ වේ.

**යෝජනා**

- පූජා භූමිය තුළ හරිත ප්‍රවාහනය (විද්‍යුත් වාහන, පොදු ප්‍රවාහන සේවා, පාපැදි භාවිතය සහ පයින් ගමන් කිරීම ආදී) ප්‍රවර්ධනය කළ යුතුවේ.

- පූජා භූමි ප්‍රදේශයේ සිද්ධස්ථාන සහ පුරා විද්‍යාත්මක වටිනාකම් සහිත සංචාරක ආකර්ෂණීය ස්ථාන යා කෙරෙමින් දැනට ඉදි කර ඇති වටවන්දනා පාර (Ring Road) සංවර්ධනය කිරීම.

- වටවන්දනා පාරේ සිට ස්ථානයන්ට සහ අදාල දිශාව ඇති දුර දැක්වෙන මාර්ගෝපදේශ නාමපුවරු වටවන්දනා පාරේ තෝරාගත් ස්ථානවල සවි කිරීම.

- අභ්‍යන්තර පොදු ප්‍රවාහන සේවයක් ක්‍රියාත්මක කිරීම.
  මෙම පොදු බස් රථ සේවය වටවන්දනා පාරේ ආරම්භ කිරීමට යෝජනා කෙරේ. මෙම බස් රථවල ගමන් මාර්ගය - *ජය ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි සෑය, ථූපාරාමය, ලංකාරාමය, සඳකඩපහන, අභයගිරිය, කුට්ටම්පොකුණ, ජේතවනාරාමය, මිරිසවැටිය, ඉසුරුමුණිය, රන්මසු උයන සහ වෙස්සගිරියෙන් නැවතත් අනුරාධපුර දුම්රිය ස්ථානයට.*

- පූජනීය සිද්ධස්ථාන අතර බැතිමතුන්ට පහසුවෙන් පා ගමනින් ගමන් කළ හැකි වන පරිදි මංපෙත සකස් කළයුතු ස්ථාන හඳුනා ගෙන ඒවා සංවර්ධනය කිරීම.

- පා පැදි මංතීරු සකස් කිරීම.

- වෙස්සගිරිය පුරාවිද්‍යා රක්ෂිත භූමිය මඟහැර යන ආකාරයට විකල්ප මාර්ගයක් ඉදි කිරීම.

- පදික මංතීරු සහිතව මාර්ග පුළුල් කිරීම.

- රථගාල් සංවර්ධනය කිරීම.

පූජා භූමිය තුළ ප්‍රවේශ මාර්ග සහ රථගාල් දැක්වෙන ස්ථාන සිතියම් අංක 5.2 මගින් දක්වා ඇත.

**සිතියම් අංක 5.2 අනුරාධපුර පූජා භූමිය තුළ ප්‍රවේශ මාර්ග සහ රථගාල් දැක්වෙන ස්ථාන**




## 5.6 භූ දර්ශනය

### අවශ්‍යතාවය

ජනාවාසවීම හා සංවර්ධන කටයුතු නිසා අඩුවෙමින් පවතින අනුරාධපුර පූජා භූමියේ වන ආවරණය වැඩි කර, අනන්‍ය වූ පරිසර පද්ධති රැකගනිමින් නිර්මිත හා ස්වභාවික පරිසර පද්ධතීන් අතර මනා සම්බන්ධතාවයක් ඇතිකර පිරිසිදු හා විධිමත් පරිසරයක් ඇති කිරීම මෙහි අරමුණ වේ.

**යෝජනා**

- පූජා භූමිය තුළ පැරණි, මැරුණු ගස් සහ අනාරක්ෂිතව පිහිටි ගස් ඉවත් කිරීම, නව ගස් රෝපණය කිරීම.

  ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව සහ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී රාජ්‍ය දැව සංස්ථාව මගින් මැරුණු ගස් සහ අනාරක්ෂිතව පිහිටි ගස් ඉවත් කිරීමට කටයුතු කළ යුතු ය. පූජා භූමි සංවර්ධන සමාලෝචන කමිටුවේ අනුමැතිය ලබාගෙන පූජා භූමිය තුළ නව ගස් රෝපණය කිරීම ඕනෑම පාර්ශවයක් මඟින් සිදු කළ හැකිය.

- සංවර්ධනය කිරීමට යෝජිත මංපෙත් දෙපස සෙවණ ලබාදෙන ගස් වර්ග සිටුවා භූ දර්ශනය කිරීමට සහ රාත්‍රි කාලයේදී පවා බැතිමතුන්ට පහසුවෙන් ගමන් කළ හැකි වන පරිදි ආලෝකමත් කිරීම.
- වැසිකිළි පද්ධතිවලින් දර්ශනයට වන හානිය වැළකීම සඳහා තුරුලතා ආවරණ (Tree curtain) ඇතිකිරීම
- පූජා භූමිය තුළ පිහිටි වටිනා ශාක නාමකරණය කිරීම
- පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් කැණීම් කොට පුරා විද්‍යා සංරක්ෂිත ලෙස ප්‍රකාශයට පත්කරන තෙක් පුරා විද්‍යා වටිනාකමින් යුත් ස්ථාන භූ දර්ශනය කර පවත්වාගෙන යාම
- වැව් සහ පොකුණු සංවර්ධනය කිරීම.
- සෑම වැවකම ජල පෝෂක ප්‍රදේශ වනාන්තර ලෙස පවත්වාගෙන යාම
- පූජා භූමිය තුළ දිශාව දැක්වෙන නාමපුවරු, ගමන් මාර්ග දැක්වෙන සිතියම් සහිත පුවරු, ඒ ඒ ස්ථානයේ ඓතිහාසික /පුරාවිද්‍යාත්මක වටිනාකම් සඳහන් නාමපුවරු සහ අවවාදාත්මක දැන්වීම් දැක්වෙන පුවරු සවි කිරීම.

අනුරාධපුර පූජා භූමිය තුළ භූ දර්ශන කටයුතුවලට අදාළ සංවර්ධන යෝජනා සිතියම් අංක 5.3 මගින් දක්වා ඇත.

**සිතියම් අංක 5.3 - අනුරාධපුර පූජා භූමිය තුළ භූ දර්ශනයට අදාළ සංවර්ධන යෝජනා**



**5.7 වානිජ කටයුතු**

**අවශ්‍යතාවය**

අනුරාධපුර පූජා භූමියේ නිසංසල පරිසරයට හානිවන ආකාරයෙන් අවිධිමත් ලෙස සිදුවන වෙළඳාම් කටයුතු විධිමත් ලෙස ස්ථානගත කිරීමත්, ප්‍රදේශයේ පවතින සම්පත් උපයෝගි කරගත් දේශීය ආහාරපාන හා භාණ්ඩ අළෙවිය සඳහා පහසුකම් ඇතිකිරීම මගින් ප්‍රාදේශීය ජනතාවගේ ජීවනෝපායන් නගා සිටුවීම මෙහි අරමුණ වේ.

**යෝජනා**

**ස්ථිර වෙළඳාම**

- පූජා භූමිය තුළ පිහිටි රථගාල්වල (වින්‍යාස සැලැස්මේ දක්වා ඇත ) ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සැලැස්මකට අනුව ආහාර පාන, දේශීය භාණ්ඩ, පූජා භාණ්ඩ අලෙවි කිරීම සඳහා ස්ථිර වෙළඳසැල් ඉදිකිරීම.

**තාවකාලික වෙළඳාම**

- පූජා භූමිය තුළ පිහිටි රථගාල්වල ජංගම වෙළඳාම සඳහා අවසර ලබා දීම.
- ආහාර සහ පූජා භාණ්ඩ අලෙවිකිරීමේදී පරිසර හිතකාමී දේශීයව සපයාගත හැකි අමුද්‍රව්‍ය වලින් සකස්කරනු ලබන දවටන බහාලුම් භාවිතා කිරීමට යෝජනා කෙරේ.

**5.8 සංචාරක කටයුතු**

**අවශ්‍යතාවය**

අනුරාධපුර පූජා භූමියට පිවිසෙන බැතිමතුන් හා සංචාරකයින් සඳහා නිසි මඟපෙන්වීමක් සහ තොරතුරු සැපයීමක් දැනට ක්‍රියාත්මක නොවන බැවින්, නිසි ක්‍රමවේදයකට අනුව මඟපෙන්වීමක් හා තොරතුරු සැපයීමක් සඳහා පහසුකම් ඇති කිරීම, දැනට අවම සංචාරක ආකර්ශනයක් පවත්නා ස්ථාන සංචාරකයින් සඳහා හඳුන්වාදීම සහ දැනට පවතින පහසුකම් වැඩිදියුණු කිරීම මෙහි අරමුණු වේ.

**යෝජනා**

- නවීන පහසුකම් සහිත තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකිරීම.
  මේ යටතේ ඕනෑම වයස් කාණ්ඩයක සිටින පුද්ගලයෙකුට ගෝචර වන ආකාරයට අනුරාධපුර ශිෂ්ටාචාරයට අයත් සියළුම තොරතුරු ආවරණය කරමින් ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්තමානය දක්වා තොරතුරු පිළිබඳව දැනුවත් කිරීමක් සිදු කළ යුතු ය. මෙම තොරතුරු මධ්‍යස්ථානය අනුරාධපුරයටම ආවේණික වූ වාස්තු විද්‍යාත්මක ලක්ෂණයන්ගෙන් යුක්ත විය යුතු ය. සනීපාරක්‍ෂක පහසුකම්, රථ ගාල් පහසුකම්, රථ ගාලේ සිට ආබාධිත ප්‍රවේශ පහසුකම්, ආපන ශාලාවක් සහ පූජා භූමියට ප්‍රවේශවන ජනතාව සඳහා කුලී පදනමක් මත ලබා ගත හැකි වාහන/පාපැදි සඳහා පහසුකම් සැපයිය යුතු ය. එක් එක් සිද්ධස්ථාන හා ආගමික උත්සව පිළිබඳ වාර්තා වැඩසටහන් කෙටි වීඩියෝ දර්ශන මගින් තොරතුරු ඉදිරිපත් කළ යුතු ය.

- සිද්ධස්ථාන පිළිබඳව තොරතුරු සහ මගපෙන්වීම සඳහා ප්‍රධාන පිවිසුම්වල ඉදිකෙරෙන ද්වාර මණ්ඩපවල ඩිජිටල් පුවරු මගින් ඒ ඒ ස්ථානයේ ඓතිහාසික /පුරාවිද්‍යාත්මක වටිනාකම් සඳහන් තොරතුරු ප්‍රදර්ශනය කිරීම.

- අභය වැව උද්‍යානය සංවර්ධනය කිරීම.
  මෙහි රථගාලක්, ඇඳුම් මාරු කර ගැනීමේ ස්ථානයක් සහිතව නාන තොටුපොළක්, ආහාර ගැනීම සඳහා පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සැලසීම.
- වෙස්සගිරිය ප්‍රදේශය අධ්‍යාත්මික සංවර්ධනයට සුදුසු වන ආකාරයට සැලසුම් කිරීම. (උදා: භාවනානුයෝගී කටයුතු සඳහා වෙන්කිරීම).
- රන්මසු උයන පාරිසරික සංචාරක ප්‍රවර්ධන කලාපයක් ලෙස සංවර්ධනය කිරීම.
- ප්‍රදේශයෙන් සුලභව සපයාගත හැකි දේශීය අමුද්‍රව්‍ය (උදා: මැටි, ගල්, දැව, කෙසෙල් කොළ, පන් ආදී) භාවිතයෙන් සංචාරකයින් සඳහා නිෂ්පාදන (උදා: ලී කැටයම්, සැමරුම්, පන්කොළ තොප්පි) සකස්කිරීම, අලෙවිය සහ ප්‍රවර්ධනය.

- පුදබිම අභ්‍යන්තරයේ ගමන්කිරීම සඳහා කුලියට පාපැදි ලබාගැනීමේ පහසුකම් වටවන්දනා පාරේ රථගාල් ආශ්‍රිතව ඇතිකිරීම ඉහත සංචාරක කටයුතුවලට අදාල සංවර්ධන යෝජනා සිතියම් අංක 5.4 මගින් දක්වා ඇත.

**සිතියම් අංක 5.4 - අනුරාධපුර පූජා භූමිය තුළ සංචාරක කටයුතුවලට අදාල සංවර්ධන යෝජනා**




### 5.9 නේවාසික කටයුතු

**අවශ්‍යතාවය**

පූජා භූමිය තුළ රැඳී සිටින අනවසර පදිංචිකරුවන් ඉවත්කර නේවාසික කටයුතු සඳහා උචිත ස්ථානයන්ට පුනස්ථාපනය කර පුරාවිද්‍යා වටිනාකම් සහිත භූමිය සංරක්ෂණය කිරීමට ඉඩ සැලසීම මෙහි අරමුණ වේ.

**යෝජනා**

- මෙම සැලසුම් වාර්තාවේ තෙවන කොටසෙහි දක්වා ඇති "පූජා භූමිය තුළ සංවර්ධන කටයුතු සිදුකිරීමේදී අනුගමනය කළ යුතු නිර්ණායකයන්හි" 2.4 හා 3.3 හි සඳහන් නිර්ණායක අනුව සංවේදී කලාපය හා පොදු පහසුකම් කලාපය තුළ නිවාස ඉදිකිරීම සඳහා අවසර ලබාදීම

### 5.10 විදුලිය හා සන්නිවේදනය

**අවශ්‍යතාවය**

රාත්‍රී කාලයේදී අඳුරේ පවතින සිද්ධස්ථාන පරිශ්‍ර ආලෝකමත් කරමින් සිද්ධස්ථානයන්ට හා බැතිමතුන්ට වැඩි ආරක්‍ෂාවක් ලබාදීම සහ නවීන සන්නිවේදන ක්‍රමෝපායන් මගින් අනුරාධපුර පූජා භූමි සිද්ධස්ථාන පිළිබඳව දැනුවත් කිරීම මෙහි අරමුණු වේ.

**යෝජනා**

- නිරන්තර/දෛනික සැපයුම (Regular supply)" පෙර සූදානම් කරන ලද සැපයුම (Stand-by supply) සහ විශේෂ සැපයුම (Special supply) යන ආකාර 03 යටතේ පූජා භූමිය සඳහා විදුලිය සැපයීම.

- විදුලිය හා සන්නිවේදන පහසුකම් සැලසීමේදී සම්ප්‍රේෂණය කටයුතු සඳහා භූගත විදුලි රැහැන් භාවිතා කිරීම
- මංපෙත් ආලෝකකරණයේදී ස්වාභාවික කහ එළිය සහිත (Day light) විදුලි බල්බ භාවිතා කිරීම
- අටමස්ථාන පිළිබඳව සහ ප්‍රවේශ මාර්ග පිළිබඳ තොරතුරු ඇතුළත් වෙබ් අඩවියක් හඳුන්වාදීම

5.11 අධ්‍යාපන

අවශ්‍යතාවය

ඉපැරණි අනුරාධපුර ශිෂ්ටාචාරය හා සබැඳි විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ තොරතුරු ඉදිරි පරම්පරාවන්ට දායාද කිරීමත් බෞද්ධ දර්ශනය සහ සංස්කෘතිය අධ්‍යයනය කිරීම ප්‍රවර්ධනය කිරීමත් මෙහි අරමුණ වේ.

යෝජනා

- පූජා භූමිය තුළ පිහිටි බෞද්ධ අධ්‍යාපන ආයතනවලට අවශ්‍ය පහසුකම් සැලසීම. මෙම සැලසුම් වාර්තාවේ තෙවන කොටසෙහි දක්වා ඇති "පූජා භූමිය තුළ සංවර්ධන කටයුතු සිදුකිරීමේදී අනුගමනය කළ යුතු නිර්ණායකයන්" ට අනුව මෙම පහසුකම් සැපයිය යුතු ය.

5.12 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු

අවශ්‍යතාවය

පොලිතින්, ප්ලාස්ටික් වලින් වන හානිය අවම කිරීම තුළින් පූජා භූමියේ පවිත්‍රතාවය හා තිරසර පරිසර පද්ධතිය පවත්වාගෙන යාම මෙහි අරමුණ වේ.

යෝජනා

- මල්, හඳුන්කූරු, පූජා භාණ්ඩ අලෙවියේදී දිරාපත්වන අමුද්‍රව්‍ය යොදාගත් පරිසර හිතකාමී දවටන සහ බහාලන හඳුන්වාදීම
- ආහාර පාන පූජා කිරීම සඳහා දැනට භාවිතා කරන මැටි බඳුන් නැවත භාවිතා නොකර ඒ වෙනුවට පන්, කඩදාසි, පුවක් කොළපත් ආශ්‍රයෙන් නිෂ්පාදිත බඳුන් හඳුන්වාදීම
- පූජාකර ඉවතලන මල් හා අනෙකුත් දිරාපත් වන කසල භාවිතයෙන් පොහොර නිපදවීම
- ඒ ඒ ද්‍රව්‍ය සඳහා වෙන්කරනලද කසළ බඳුන් බැතිමතුන් වැඩිපුර ගැවසෙන පූජනීය සිද්ධස්ථාන රථගාල්, වෙළඳසැල්, විවේකී ස්ථාන සහ නාන තොටුපොළ ආශ්‍රිතව කසළ බඳුන් තැබීම

## අනුරාධපුර පූජා භූමිය තුල සංවර්ධන කටයුතු සිදු කිරීමේදී අනුගමනය කළ යුතු නිර්ණායක

1.0 අධිසංවේදී හා සංවේදී කලාප තුළ සංවර්ධන කටයුත්තක් සිදුකිරීමේදී අනුගමනය කළ යුතු පොදු නිර්ණායක

1.1. පොදු කරුණු

1.1.1. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පුරාවිද්‍යා වෙන්කල භූමි ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ තුළ කිසිම සංවර්ධන කටයුත්තකට අවසර හිමි නොවේ.

1.1.2 එසේ වුවද, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය මත යම් සංවර්ධන කටයුත්තක් සිදුකළ යුතු අවස්ථාවකදී ඒ සඳහා අවසර හිමිවේ.

1.1.3 අධිසංවේදී සහ සංවේදී කලාප තුළ නව පූජනීය සිද්ධස්ථාන ඉදිකිරීම් නොකළ යුතු ය.

1.1.4 අධිසංවේදී සහ සංවේදී කලාප තුළ ප්‍රචාරක දැන්වීම් පුවරු ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

1.1.5 අධිසංවේදී සහ සංවේදී කලාප තුළ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමත නිර්මිතයන් පරිදි සකස් කරන ලද පුවරු පමණක් ස්ථාපිත කිරීමට අවසර හිමිවේ.

1.2 ස්ථිර ඉදිකිරීම්

1.2.1 පුරාවිද්‍යා වෙන්කල ඉඩම් සහ නටඹුන් සහිත ප්‍රදේශ ආශ්‍රිතව යම් සංවර්ධන කටයුත්තක් සිදු කරන්නේ නම්, එම සංවර්ධන කටයුත්තට සහ අදාල සැලසුම්වලට ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිර්දේශය සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශය ද ලබා ගෙන පූජා භූමි සංවර්ධන සමාලෝචන කමිටුවට (අංක අමප/18/0497/724/020 දරන 2018 අප්‍රේල් මස 04 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පිහිටුවන ලදී.) ඉදිරිපත් කොට එම කමිටුවේ එකඟතාවය ලබා ගත යුතු ය. කෙසේවුවද, සංවේදී කලාපයේ පිහිටි අනුමත නේවාසික ප්‍රදේශ තුල සුවිශේෂී ගැටළුවක් ඇතිවන අවස්ථාවකදී එම ගැටළු පූජා භූමි සංවර්ධන සමාලෝචන කමිටුවට ඉදිරිපත්කර එකඟතාවය ලබා ගත යුතු ය.

1.2.2 අදාල සංවර්ධන කටයුත්ත සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් සහ අදාල පළාත් පාලන ආයතනයෙන් අනුමැතිය ලබා ගත යුතු ය.

1.2.3 යම් ආයතනයක් හෝ පුද්ගලයෙක් මෙම නිර්ණායක උල්ලංඝනය කරමින් ඉදිකිරීම් සිදු කරන්නේ නම්, ඒවා අනවසර ඉදිකිරීම් ලෙස සලකනු ලබන අතර, එම අනවසර ඉදිකිරීම් සම්බන්ධව 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධිවිධානවලට අනුව නාගරික සංවර්ධන අධිකාරිය හෝ 1944 අංක 84 දරන මහා නගර සභා පනතේ විධිවිධානවලට අනුව අනුරාධපුර මහා නගර සභාව හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානවලට අනුව මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව විසින් නීතිමය කටයුතු කළ යුතු ය.

1.2.4 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව හෝ නාගරික සංවර්ධන අධිකාරිය හෝ අනුරාධපුර මහා නගර සභාව හෝ මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව විසින් කලාපීය සැලැස්මක් හෝ තම බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේදී හෝ යාවත්කාලීන කිරීමේදී මෙම නිර්ණායකයන්ට අනුකූලව කටයුතු කල යුතු ය.

1.3 තාවකාලික ඉදිකිරීම්

1.3.1 ආගමික හෝ වෙනත් උත්සවලදී සිදුකරනු ලබන තාවකාලික සනීපාරක්ෂක පහසුකම් සහ ජල ටැංකි, මල් හා පූජා භාණ්ඩ වෙළඳ සැල්, ප්‍රදර්ශන කුටි, දන් සැල්, ප්‍රථමාධාර හා ගිනි නිවන ඒකක ආදී තාවකාලික ඉදිකිරීම්වලට ඉඩ සැලසෙන අතර එකී තාවකාලික ඉදිකිරීම් සිදු කිරීමේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශය සහිතව අනුරාධපුර මහ නගර සභාවේ හෝ මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගත යුතු ය. එම කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතු ය. එම කාර්යය නිමාවීමත් සමඟ තාවකාලික ඉදිකිරීම් ඉවත් කළ යුතු අතර එසේ ඉවත් කළ පසු ඒ බව අදාල පළාත් පාලන ආයතනය වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

1.4 ප්‍රවේශ මාර්ග සහ කාණු පද්ධති

1.4.1 පූජනීය ස්ථානවලට පා ගමනින් යන (අභ්‍යන්තර මාර්ග) මාර්ග දිවා කාලයේදී පවා බැතිමතුන්ට පහසුවෙන් ගමන් කළ හැකි වන පරිදි පරිසර හිතකාමී ද්‍රව්‍ය භාවිතයෙන් සකස් කළ යුතු ය. (උදා - වෙස්සගිරිය පුරාවිද්‍යා සංරක්ෂිත භූමියේ අභ්‍යන්තර මාර්ග සකස් කර ඇති ආකාරය - බොරළු, අළුහුණු සහ සිමෙන්ති මිශ්‍රණය).

1.4.2 කාණු පද්ධති සකස් කිරීමේදී භූගත ආකාරයට හෝ මතුපිට ආවරණ සහිතව අදාල ප්‍රදේශයේ අවශ්‍යතාවයට අනුව සකස් කළ යුතු ය.

1.5 රථගාල්

1.5.1 රථගාල් පහසුකම් ඉදි කිරීමේදී අනුරාධපුර පූජා භූමි වින්‍යාස සැලැස්මේ දක්වා ඇති ස්ථානවල පමණක් අවසර හිමිවේ. (උපලේඛන 01හි දක්වා ඇත)

1.6 කුඹුරු හා වන රක්ෂිත

1.6.1 දැනට පවතින කුඹුරු හා වන රක්ෂිත එපරිද්දෙන්ම පවත්වාගෙන යාමට ඉඩදිය යුතු අතර, වෙනත් භාවිතයන් සඳහා යෙදවීමට ඉඩ දෙනු නොලැබේ. කුඹුරු වගාකරන කාලයට පමණක් කුඹුරු මත පැල්පතක් හෝ මැස්සක් අටවා ගැනීමට අවසර දෙනු ලැබේ. මේ සඳහා අදාල වසමේ ග්‍රාම නිලධාරීගේ අනුමැතිය ලබා ගත යුතු අතර එම කාර්යය නිමවීමත් සමඟ තාවකාලික ඉදිකිරීම් ඉවත් කළ යුතු අතර එසේ ඉවත් කළ පසු ඒ බව අදාල ග්‍රාම නිලධාරී වෙත දැනුම් දිය යුතු ය.

1.6.2 වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ අධීක්ෂණය වන වැව්වල, වැව් රක්ෂිතය වන තීරයක් ලෙස (Buffer Zone) පවත්වාගෙන යා යුතු අතර අනුරාධපුර ප්‍රදේශයේ පවතින වියළි දේශගුණික සහ පාරිසරික තත්ත්වයන්ට යෝග්‍ය ගස්, වන වගාවක් ලෙස රෝපණය කළ යුතු ය.

1.6.3 පූජා භූමි සීමාව තුල මැරුණු සහ අනතුරුදායක ගස් ඉවත් කර ඒ වෙනුවට ප්‍රදේශයට ගැලපෙන ගස් සිටුවා රැකබලා ගැනීම ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශිය ලේකම් සහ අදාල පළාත් පාලන ආයතනය මඟින් සිදු කළ යුතු ය.

**1.7 ජල මාර්ග, වැව් හා පොකුණු**

1.7.1 වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ අදාල පළාත් පාලන ආයතනය විසින් ජල මාර්ග, වැව් හා පොකුණු ප්‍රදේශවාසීන්ගේ හා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ස්වාභාවික සම්පතක් ලෙස රැක ගනිමින් නඩත්තු කළ යුතු ය.

**1.8 අප ජලය බැහැර කිරීම**

1.8.1 ගොඩනැගිලිවලින් බැහැර කරනු ලබන අප ජලය පිරිපහදු කිරීමෙන් පසුව විධිමත් ක්‍රමවේදයකට අනුව අපජලය ඉඩම තුලම කළමනාකරණය වන බවට සැලසුම් අනුමත කිරීමේ කමිටුව විසින් තහවුරු කර ගත යුතු ය.

**1.9 ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීම**

1.9.1 පූජා භූමිය තුල සියලුම ඝණ අපද්‍රව්‍යය දිරාපත්වෙන සහ දිරාපත් නොවෙන (ප්ලාස්ටික්, වීදුරු සහ මැටි බඳුන්) ලෙස වර්ගීකරණය කර බැහැර කළ යුතු අතර එම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයක් වෙත අනුරාධපුර මහා නගර සභාව හෝ මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශීය සභාව විසින් ලබා දිය යුතු ය.

1.9.2 දේවානම්පියතිස්සපුර I, II, III, IV සහ යෝජිත ලෝලුගස්වැව යන ගම්මාන වලින් වර්ගීකරණය කොට එකතුකරනු ලබන ඝණ අපද්‍රව්‍යය මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව විසින් විධිමත් ලෙස බැහැර කළ යුතු ය.

1.9.3 ඉහත 1.9.1 සහ 1.9.2ට අදාළ නොවන පූජා භූමියේ සෙසු ප්‍රදේශ වලින්, එනම් අනුරාධපුර මහා නගර සභා සීමාව තුල ජනනය වන ඝණ අපද්‍රව්‍යය අනුරාධපුර මහා නගර සභාව විසින්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ජනනය වන ඝණ අපද්‍රව්‍යය මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශීය සභාව විසින්ද වර්ගීකරණය කර විධිමත් ලෙස බැහැර කළ යුතු ය.

1.9.4 කිරි ආහාර, මල් සහ අනෙකුත් පූජා ද්‍රව්‍යයන් පූජා කිරීම සඳහා කාඩ් බෝඩ්, කොළපත් වැනි පරිසර හිතකාමී අමුද්‍රව්‍ය භාවිතයෙන් සකස්කරනු ලබන බහාලුම් භාවිතය ප්‍රවර්ධනය කළ යුතු ය.

1.9.5 අනුරාධපුර පූජා භූමිය පොලිතීන් සහ ප්ලාස්ටික්වලින් තොර පරිසර හිතකාමී කලාපයක් බවට පත්කල යුතු වන්නේය.

තවද, පූජා භූමි සංවර්ධන සමාලෝචන කමිටුවේ නිර්දේශය සහිතව පරිසර හිතකාමි කලාපයක් පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ බලතල භෞතික සැලැසුම් විෂයභාර අමාත්‍යවරයා සතුවේ.

**1.10 නාන තොටුපොලවල්**

1.10.1 පූජා භූමි වින්‍යාස සැලැස්මෙන් අවසර දෙනු ලබන ප්‍රදේශවල පමණක් මේ සඳහා අවසර හිමිවේ. (උපලේඛණ 01 හි ඇතුළත් කර ඇත).

**1.11 ජංගම වෙළදාම**

1.11.1 පූජා භූමි වින්‍යාස සැලැස්මෙන් පෙන්වා දෙනු ලබන ස්ථානවල පිහිටි රථගාල් තුල පමණක් ජංගම වෙළදාම සඳහා අවසර හිමිවේ. මල්, පූජා භාණ්ඩ, රසකැවිලි, ආහාරපාන ආදිය සඳහා පමණක් අවසර හිමිවේ.

**1.12 වෙළඳ සැල්**

1.12.1 පූජා භූමියේ නිශ්චිතව හදුනාගත් ප්‍රදේශවල, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ හෝ නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස්කරන ලද සැලැස්මට අනුව මල් සහ පූජා භාණ්ඩ අලෙවි සැල්, ආහාර ද්‍රව්‍යය (කෙටි කෑම, තේ සහ පාන වර්ග) අලෙවි සැල් සහ දේශීය අත්කම් භාණ්ඩ අලෙවි සැල් ඉදිකිරීමට අවසර හිමිවේ.

1.12.2 මල් සහ පූජා භණ්ඩ අලෙවි සැලක් සඳහා ගෙබිම ප්‍රමාණය උපරිමය වර්ග අඩි 50 ද ආහාර ද්‍රව්‍යය සපයන අනෙක් වෙළඳසැල් සඳහා ගෙබිම ප්‍රමාණය උපරිමය වර්ග අඩි 100 ක් ද දේශීය අත්කම් භාණ්ඩ අලෙවි සැලක් සඳහා ගෙබිම ප්‍රමාණය උපරිමය වර්ග අඩි 100 ක් ද විය යුතු ය.

1.12.3 මෙම අලෙවි සැල් ඉදිකිරීමේදී වහලයේ සැකිල්ල දැව වලින් නිම විය යුතු අතර සෙවිලි තහඩු ලෙස දුඹුරු /ඇදිරි කොල/ ගුරු පැහැ වැනි පෞරාණික භූ දර්ශණයට ගැලපෙන සහ පරිසරයට අනුගත වර්ණයන්ගෙන් යුත් උළු හැඩැති සින්ක් ඇලුමිනියම් තහඩු භාවිතා කළ යුතු ය. බිත්ති ගඩොල් වලින් ද පොළව සිමෙන්ති පැහැයෙන් ද නිම විය යුතු ය.

**1.13 විදුලිය**

1.13.1 විදුලිය සම්ප්‍රේෂණය කිරීම සඳහා හැකි සෑම අවස්ථාවකම භූගත විදුලි රැහැන් හෝ දර්ශනයට බාධා නොවන ආකාරයෙන් ආවරණය කරන ලද විදුලි රැහැන් භාවිතා කළ යුතු ය.

**1.14 ඉඩනොදෙන භාවිතයන්**

1.14.1 මස් හා මාළු වෙළඳ සැල්, මත්පැන් නිෂ්පාදන හා අලෙවි සැල්, සිනමාහල්, විශාල සාප්පු සංකීර්ණ, ඉන්ධන පිරවුම්හල්, වාහන සේවා මධ්‍යස්ථාන, කර්මාන්ත ශාලා, මංසන්දි හෝ මාර්ග දෙපස ආගමික ප්‍රතිමාවන් /සංකේත සහ නව සුසාන භූමි සඳහා ඉඩදෙනු නොලැබේ. සංවේදී කලාපය තුළ දැනට පවතින කටුකැලියාව, තිසාවැව සහ බුලන්කුලම යන සුසාන භූමි පමණක් එපරිද්දෙන්ම පවත්වාගෙන යාමට අවසර හිමි වේ.

**2.0 අධිසංවේදී කලාපය තුළ සිදුකරනු ලබන ඉදිකිරීම් / සංවර්ධන කටයුතු**

**2.1 අධි සංවේදී කලාපය තුළ යම් සංවර්ධන කටයුත්තක් සිදුකිරීමේදී පහත සඳහන් නිර්ණායකයන් අනුගමනය කළ යුතු ය.**

2.1.1 මෙම කලාපය තුළ බැතිමතුන්ගේ වන්දනාමාන හා ආගමික කටයුතුවලට අදාල කාර්යයන් සඳහා පමණක් අවසර හිමි වේ.

**2.2 බැතිමතුන් සඳහා පහසුකම්**

2.2.1 බැතිමතුන් සඳහා ආරක්ෂාව සැලසීමට අදාල ගොඩනැගිලි, සනීපාරක්ෂක ගොඩනැගිලි, සහ අත්‍යාවශ්‍ය අපරව්‍යුහ පහසුකම් ඉදිකිරීමට පමණක් අදාල ආයතනයන්හි නිර්දේශයට යටත්ව අවසරය හිමිවේ

**2.3 සංවර්ධන කටයුතු**

2.3.1 පූජනීය ස්ථානයන්හි සිදුකරන නව ඉදිකිරීම්, පිහිටි පොළවේ සිට වහලයේ උසද ඇතුලත්වන පරිදි මීටර් 10 ක උපරිම උසකට යටත්ව සිදු කළ යුතු ය. උපරිමය මහල් දෙකකින් (G+1) යුක්ත විය යුතු ය. භූගත මහල් සඳහා අවසර හිමි නොවේ.

2.3.2 වගන්ති අංක 1.2.2 යටතේ අනුමැතිය ලබාදී ඇති අනෙකුත් සියලු ඉදිකිරීම් පිහිටි පොළොවේ සිට මීටර් 7.5ක උසකට යටත්ව තනි මහලේ ඉදිකිරීම් විය යුතු අතර භූගත මහල් සඳහා අවසර හිමි නොවේ.

2.3.3 ගොඩනැගිලිවල වහල හතරපල වහලයක් ලෙස සකස් විය යුතු අතර වහලයේ සැකිල්ල, දොර, ජනෙල් සහ උළුවහු සඳහා දැව භාවිත කළ යුතු අතර එහි ආලේපනය දැව වර්ණයෙන්ම විය යුතු ය. ගොඩනැගිලි ඇතුලත භාවිතාව සඳහා ඇලුමිනියම් භාවිතා කරන්නේ නම් එය දැව වර්ණයේ නිමාවෙන් විය යුතු ය.

2.3.4 සියලුම ගොඩනැගිලිවල වහල ආවරණය සඳහා උලු හෝ දුඹුරු /ඇදිරි කොල/ ගුරු පැහැ වැනි පෞරාණික භූ දර්ශණයට ගැලපෙන සහ පරිසරයට අනුගත වර්ණයන්ගෙන් යුත් උළු හැඩැති සින්ක් ඇලුමිනියම් තහඩු භාවිතා කළ යුතු ය.

2.3.5 එම ගොඩනැගිලිවල පිටත බිත්ති වර්ණ ගැන්වීමේදී සුදු හෝ මැටි වර්ණය භාවිතා කළ යුතු ය. තීන්ත ආලේපන වර්ග තෝරා ගැනීමේදී බැරලෝහ වලින් තොර පරිසර හිතකාමී ආලේපන වර්ගයක් භාවිතා කළ යුතු ය.

**2.4 නිවාස**

2.4.1 අධිසංවේදී කලාපය තුළ කිසිඳු නේවාසික භාවිතයකට ඉඩදෙනු නොලැබේ. දැනට මෙම කලාපය තුළ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් වෙන් කල ඉඩම් ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ සහ නටඹුන් සහිත ඉඩම් හෝ සෙසු ප්‍රදේශවල මිනිසුන් පදිංචි වී සිටී නම් ඒ අය ඉවත් කිරීම හෝ විකල්ප වාසස්ථාන ලබාදිය යුතු ය. මෙතෙක් පුරා විද්‍යා සංරක්ෂණ කලාප ලෙස ප්‍රකාශයට පත් නොකළ පුරාවස්තු පවතින ප්‍රදේශ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කර සංරක්ෂණය කොට පවත්වා ගත යුතු ය.

2.4.2 අධිසංවේදී කලාපය තුළ පවතින භාවිතයට නොගත් ඉඩම්, පුරා විද්‍යාත්මක කැණීම් සහ සංරක්ෂණ කටයුතු සිදු කරන තෙක්, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සැලැස්මකට අනුකූලව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් භූ දර්ශනය කොට පවත්වා ගත යුතු ය.

**3.0 සංවේදී කලාපය තුළ සිදුකරනු ලබන ඉදිකිරීම් / සංවර්ධන කටයුතු**

සංවේදී කලාපය තුළ යම් සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී පහත සඳහන් නිර්ණායකයන් අනුගමනය කළ යුතු ය.

**3.1 පූජනීය සිද්ධස්ථාන**

3.1.1 මෙම කලාපය තුළ නව පූජනීය සිද්ධස්ථාන ඉදිකිරීමට අවසර හිමි නොවේ. නමුත්, ඉදිරියේදී පුරා විද්‍යා කැණීම් වලින් පැරණි විහාරස්ථානයක නටඹුන් හෝ පුරාවස්තු හමුවුවහොත් පමණක් එම ස්ථාන සංරක්ෂණය කර පවත්වාගෙන යා යුතු ය.

3.1.2 සංවේදී කලාපය තුල අවසර දෙනු ලබන භාවිතයන් උපලේඛණය 02හි සඳහන් කර ඇත.

**3.2 සංවර්ධන කටයුතු**

3.2.1 නව නිවාස සහ ගොඩනැගිලි ඉදිකිරීමේදී, වහලය සමග උපරිම උස පිහිටි පොළවේ සිට මීටර් 9 ක උසකට යටත්ව සිදු කළ යුතු අතර මහල් දෙකකට වඩා නොවිය යුතු ය. ඒ අනුව බිම් මහල සහ පළමු මහල පමණක් ඉදි කිරීමට අවසර හිමි වන අතර භූගත මහල් ඉදි කිරීමට අවසර හිමි නොවේ. එම ඉදිකිරීම් දුරරූපීව ආගමික සිද්ධස්ථාන ආවරණය නොකළ යුතු ය.

3.2.2 තාප්පවල උස අඩි 02 අඟල් 06 ක් දක්වා ඉදි කිරීමට අවසර හිමිවන අතර එය දැලක් වැනි දර්ශනයට බාධා නොවන ද්‍රව්‍යයක් භාවිතයෙන් උපරිමය අඩි 06ක් දක්වා සකස් කර ගැනීමට අවසර හිමි වේ.

3.2.3 නව නිවාස සහ ගොඩනැගිලිවල වහලය සකස් කිරීමේදී සෙවිලි තහඩු ලෙස උළු හෝ උළු හැඩැති සින්ක් ඇලුමිනියම් තහඩු භාවිතා කළ යුතු ය. ඒවායේ වර්ණය දුඹුරු /ඇදිරි කොල/ ගුරු පැහැ විය යුතු අතර වහලයේ සැකිල්ල සඳහා දැව භාවිතා කළ යුතු ය. වහලයේ ආනතිය 23 $1/2^0$ ක් විය යුතු ය.

